# බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2566
බක් මස 06 වන බදාදා



# බෞද්ධාලෝකය

## ආර්ය මාර්ගය හා අල්පේච්ඡතාවය

බෞද්ධ ඉගැන්වීමට අනුව ඉච්ඡාව හෙවත් ආශාව ද මිනිසාගේ අසහන කාරීත්වයට හේතුවේ. පුද්ගල ආශාව සිව් ආකාර වේ. එනම්

අත්‍රිච්චතා, පාපිච්ඡතා, මහිච්ඡතා සහ අල්පේච්ඡතා වශයෙනි.අත්‍රිච්චතා, පාපිච්ඡතා, මහිච්ඡතා යන ත්‍රිත්වය අල්පේච්ඡතාවය එහි ප්‍රතිවිරුද්ධ ඒවා වශයෙන් හැඳින්විය හැකිය.අත්‍රිච්චතාව ලෙසින් හැඳින්වෙන්නේ තමාට කොතරම් දේ ලැබුනත් අනෙකාට ලැබෙන කුඩා දෙයට පවා ආශා කිරීමයි. පාපිච්ඡ තාව ඇති පුද්ගලයා තමා තුළ නොමැති ගුණ ධර්ම ප්‍රදර්ශනය කරමින් නැති සත්‍යතාවක් එළිදක්වන්නට ගොස් අසන්තෝෂයෙන් දිවි ගෙවයි. මහිච්ඡතාව සහිත පුද්ගලයා අල්ප බලාපොරොත්තු වෙනුවට වැඩි ආශා වැඩි බලාපොරොත්තු සහිතව කාලය ගත කරයි. ආශාවෙහි පමණ නොදන්නාකම මෙහි ලක්ෂණයයි. අතිරේක අවශ්‍යතා බහුල බැවින් අවිවේකය අසන්තෘප්තිය මෙම පුද්ගලයන් කරා නිරන්තරයෙන් ලගා වේ. අල්පේච්ඡතාව බෞද්ධ ආර්ය මාර්ගයේදී මෙන්ම ලෞකික ජීවිතයේ දී ද අනුගමනය කළ යුතු සුචරිතමය ධර්මයකි. කිනම් පුද්ගලයකුට වුවද අසහනයෙන් තොරව ජීවත්වීම සඳහා දියුණු මනසක් තිබීම අත්‍යවශ්‍ය වේ.එහිදී සරල මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීම සහ අතිරේක වූ අපේක්ෂාවන් සාධනය කර ගැනීම ඉතා විචාරශීලීව කළ යුතුය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා උදෙසා අනුදැන වදාළ සතර නිශ්‍රය ධර්ම තුළින් සිවුපසය සංඝ සමාජය අල්පේච්ඡතා ගුණයට යොමු කළ ආකාරය දැකගත හැකිය. **"පින්ඩියාලෝප භෝජනං නිස්සාය පබ්බජ්ජා පාන්සකූලං චීවරං නිස්සාය පබ්බජ්ජා,"**

සිහි නුවණින් යුතුව සිව්පසය පරිභෝජනය කිරීමෙන් අසහනකාරී තත්ත්වයෙන් මෙන් ම අකුසල සිතුවිලි ද දුරු කළ හැකිය

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් මාසිකව සෑම පුර පසළොස්වක පොහෝ දිනකම පලකරනු ලබන බෞද්ධාලෝකය ඊ-පුවත්පත සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.නිර්මාණ ඉදිරිපත් කිරීමට කැමැත්තේ නම්,

එම නිර්මාණ පහත සඳහන් ලිපිනයට ලියා එවීම හෝ විද්‍යුත් ලිපිනය ඔස්සේ එවීමට කටයුතු කළ හැක (පිටු දෙකක ප්‍රමාණයට සෑහෙන තරම්)

සෑම කලාපයක්ම www.acbc.lk අප වෙබ් අඩවියෙන් නිකුත් කරන අතර මීට පෙර නිකුත් කරන ලද මාසික ඊ-පුවත්පත් අප වෙබ් අඩවියෙන් පරිශීලනය කළ හැක

බෞද්ධාලෝකය

**උපදේශක මණ්ඩලය**
මහාචාර්ය නිමල් ද සිල්වා
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**සංස්කරන කළමණාකරනය**
ඉෂාන් බුද්ධික එදිරිසූරිය

**සංස්කාරක මණ්ඩලය**
නාලක ජයසේන
ශ්‍යාම් නුවන් ගනේවත්ත

**පිටු සැකැස්ම**
කාවින්ද දිල්ෂාන්
ත්‍රිෂාන්ති දිසානායක

**ප්‍රකාශනය**
බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දූරකථනය ( 011 2691659 / 011 2665047)
ෆැක්ස් (011 2665047)
web : www.acbc.lk
E-mail : buddhistinfo380@gmail.com



# අද සැබෑ වන කොසොල් මහ රජතුමාගේ සිහින



කොසොල් මහ රජතුමා එක් දිනක් නින්දේදී දුටුව සිහින 16 ශාන්ති බ්‍රහ්මමණයට හා පුරෝහිත බ්‍රහ්මමණයට ට පැවසූ අතර සත්වයන් ගින්නට දමා යාගයක් කළ යුතු බව බමුණන් විසින් උපදෙස් දෙන ලදි. බුද්ධිමත් කොසොල් රජතුමා මල්ලිකා දේවියට ඒබව පැවසූ අතර මල්ලිකා දේවියගේ උපදෙස් මත එම යාගය පැවැත්වීමට පෙර වැඩි විස්තර දැන ගැනීමේ අදහසින් අප බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණි. එහිදී අප බුදු පියාණන් වහන්සේ යාථාර්ථවාදී දේශනාවක් කොසොල් රජතුමාට දේශනා කළහ. එනම්,

**උසභා රුක්ඛගාවියෝ ගවාව අස්සෝ කංසා**
**සිගාලිච් කුම්භො පොක්ඛරණී ච අපාක වන්දනං**
**ලාපුනි සිදන්ත සිලප්පවන්ති මණ්ඩුකියො කණ්හා සප්පෝ ගිලන්ති**
**කාකා සුවන්ණා පරිවාරයන්ති තසාවකා එලකානං භයාතිතී**

1. **කළු ගොන්නු 4 දෙනෙක් රජ මිදුලට පැන තරගෙට වගේ ඇන ගන්නා විදියට ඉඳ පිරිස එකතු වූ පසු ආපසු පැන දීවීම.**
2. **ගස් ලොකු වෙන්නට පෙර ගෙඩි හට ගැනීම.**
3. **වැදූ විගසම එම වසු පැටවාගෙන් එළදෙනුන් කිරි බීම.**
4. **පුරුදු ගොන් බාන් පුරුදු කරත්තය නොඇද නුපුරුදු කරත්තය ඇඳගෙන යාම.**
5. **දෙපැත්තෙන්ම කටවල් දෙකක් තිබූ සතෙක් දෙපැත්තෙන්ම භක්ෂණය කිරීම.**
6. **කහවනු ලක්ෂයක් වටිනා රන් තැටියකට හූනෙකු මුත්‍රා කිරීම.**
7. **මිනිසෙක් ලණුවක් අබරන අතර සිවල් දෙනෙක් එහි කෙළවර කෑම.**
8. **හිස් කළගෙඩි තිබියදී එහි නොබලා පිරුණු කළවලටම තව තවත් ජලය පිරවීම.**
9. **පොකුණක සිවුපාවුන් බැස දිය බීවත් දිය බොර නොවී දියට බැස කලබන තැනම පිරිසිදු වීම.**
10. **එක හැළියේ බත් තුන් විදියකට ඉදීම.**
11. **සඳුන් අරටුවක් ගින්නෙන් දැවී අළු වීම.**
12. **වියලුන ලබු ගෙඩියක් වතුරට දැමූ කළ දිය යට යෑම.**
13. **පර්වතයක් දිය මත පාවී තිබීම.**
14. **රන් හංසයන්ට කපුටන් රජෙක් වීම.**
15. **කුඩා මැඩියෝ සර්පයන්ව එළවීමත් සර්පයෝ මැඩියන්ට බියේ දිව යෑමත්.**
16. **දිවියෙක් පිටුපස  හරකෙක් එලවාගෙන ගොස් ඌව මරාගෙන කෑම.**

මෙම සිහින 16 තුළ අන්තර්ගත වන්නේ ගැඹුරු අර්ථයන්ය. රටක සමාජයක පිරිහීම මින් ප්‍රධාන වශයෙන් අන්තර්ගතය. එදා කොසොල් රජතුමා දුටු සිහින එදාට බලපාන ඒවා නොව අදට බලපාන ඒවා බව බුදු හිමියන් බුදු ඇසින් එදා අනාගතය බලා වදාළහ.

කරුණු කිහිපයක් ඔස්සේ එය විකාශය වී ඇති බව පැහැදිලි වේ. අද කාලීන වශයෙන් සිදුවන සියලු ප්‍රශ්න ගැටලු මෙම සිහින 16 තුළ අන්තර්ගතය. ඒවා සිදු වන අයුරු දැසින් බලාගෙන ඉන්න කෙනෙකු සේ බුදු හිමි බුද්ධ ඥාණයෙන් අද සිදුවන සියලු දේවල් එදා දේශනා කළහ.

**1.යුත්තිය දහම නොපිටට පෙරළීම.**

**2.ආයුෂ අඩු වීම.**

**3.කටේ වරද නිසා නැති ප්‍රශ්න ඇති වීම.**

**4.මව්පියන්ට වැඩිහිටියන්ට නොසැලකීම.**

**5.දූ දරුවන් හිතුමතේට ක්‍රියා කිරීම හා ගුරු දෙගුරුන්ට ද අවනත නොවීම.**

**6.සුදුසු අයට සුදුසු තැන අහිමි වී නුසුදුසු අයට එම ස්ථාන ලැබීම.**

**7.සිල්වතුන්ට,ගුණවතුන්ට පූජා සත්කාර නොකිරීමත් වද හිංසා දීමත් දුසීලයන්ට තැන දීමත් ආදිය සිදුවීම.**

**8.බොරුව, වංචාව තුලින් තවකෙකු අසරණ වීම සඳහා ක්‍රියා කිරීම.**
**9.පිරිමින්ට ආවේනික ක්‍රියා ගැහැණුන්ද කිරීම හා කිරීමට උත්සහ කිරීම.**

**10.නිවෙස් තුළ ස්වාමි භක්තිය නොකොට පරදාර සේවනය සිදුවීම.**

**11.මිල මුදල් වලට යටවී කළගුණ සැලකීම හා ගුණ ධර්ම නොදත් පිරිසක් සේ කටයුතු කිරිම.**

**12.අයබදු ගැනීම ආදිය වැඩි වී ජනතාව කැකෝ ගැසීම.**

**13.දෙපැත්තෙන්ම පාගා ගැනීම හා වාසි අතට නඩුහබ සිදුවීම.**

**14. අපරාධ දූෂණ වැඩි වීම හේතුවෙන් දෙවියන් කෝප වී අව්ව වැස්ස නිසි කළට නොදී අනිසි කළට ඒවා ලැබී ජනතාවට වද පැමිණීම.**

**15.දුසිරිත්කම් ඇති ගිහි පැවිදි අය බිහි වී බුදු සසුන කෙළසීම.**

**16. ජාතිය ක්‍රම ක්‍රමයෙන් වැනසීමත්,ඇත්ත බොරුව වී බොරුව ඇත්ත වීම මිසදිටුවන් ජය පැන් බීම.**

**17. ආගම ධර්මය තැන නොදීම හා පහත් මිනිසුන් වැදගත් අයට ගැරහීම.**

**18.අඩු වයසින් විවාහ විමෙන් ,ගැහැණුන්ට මිනිසුන් යටත් වීමත්,රාගයෙන් ජීවිතය පවා විනාශ කිරීම.**

**19.ගිහියන් විසින් කළයුතු දේවල් පැවිද්දන් කිරීමත්,පැවිද්දන් විසින් කළ යුතු දේ ගිහියන් කිරීමත්**

ආදී වශයෙන්,

එම සිහින තුළ අන්තර්ගතය එය අද සිදුවන අයුරු ඇස් කන් තිබෙන කාට වුවද අවබෝධ කරගත හැකිය.

මෙම කරුණු දැකබලා කෙනෙකුට හෝ පිරිසකට ආවේගයක් ඇති නොවිය යුතුය. එයට හේතුව මෙම කරුණු තුන් කාලයම කැඩපතකින් මුහුණ බලන්නා සේ දැකිය හැකි උත්තමයෙක් දේශනා කර තිබීම හේතුවෙනි.

එකිනෙක තනි තනිව මෙම කරුණු අධ්‍යනය කොට තම තමන් සුචරිතවත් විමයි.

දේශයන් වලට සීමා නොවී සෑම කාලයකටම සදාතනික අයුරින් බලපාන එම උතුම් පරම සත්‍යය තව තවත් ගවේශණ කොට අප සෑම දෙනෙක්ම හොඳ මින්සුන් වීමට උත්සාහවත් විය යුතුය. රටක සමාජයක් ජීවත් විමේදී අප කවුරුත් වගකීම් වලින් පිරිපුන්ව සිටින්නෙමු. එබැවින් අප සියලු දෙනාම වගකීමෙන් කටයුතු කිරීමට සිතට ගත යුතුය.

**කොළඹ ඉංජිනේරු චිත්‍රා බොතේජු (කුලතුංග)**

# බුදු පැටවුන් ගලේ සැඟවුණු සිංහල බෞද්ධ සභ්‍යත්වය



රුහුණු මායා පිහිටි තුන්සිංහලේ පිහිටි රජරට රාජධානිය පිළිබඳ බොහෝ දෙනෙකු ගේ අවධානය යොමු ව තිබුණද රුහුණු රට රාජ'ධානිය තවමත් මහ ඝන වනයට යටවී තිබේ. මෙම ඓතිහාසික සභ්‍යත්වය සැඟවී තිබෙන්නේ යාල මහ වනයේ යැයි කිවහොත් එය අසත්‍යයක් නොවේ. ඉංග්‍රීසින් විසින් 1908 දී යාල පෙදෙස අභය භූමියක් ලෙසට වෙන් කර රක්ෂිතයක් කරලීමට පළමු මාගම රුහුණු රාජධානියේ ශිෂ්ඨාචාරය එහි ජීවමානව පැවතිණ. 1815 වන විට සිංහල රාජධානි බිඳ වැටී ගිය පසු විශේෂයෙන්ම යාල සහ පානම මුල් කොට පැවති නැගනෙහිර රාජධානිය බිඳ වැටීමෙන් පසු මේ පෙදෙස ඉංග්‍රීසින් ගේ දඩබිමක් විය. යාල අභය භූමය 1983 වර්ෂයේ දී වනෝද්‍යානයක් ලෙසට ප්‍රකාශයට පත් කරන ලද අතර එහි නැගෙනහිර කොටස යලි කුමන පක්ෂි අභය භූමිය ලෙසට 2006 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කර තිබේ. බුදු පැටවුන් ගල නම් වූ වැදගත්ම ඓතිහාසික ස්ථානය පවතින්නේ වත්මන් යාල රක්ෂිතයත් කුමන රක්ෂිතයත් සීමාවේ ය.

රුහුණේ අප්‍රකට පුරාවස්තු ගැන චාරිකා සටහන් ලියන පණ්ඩිත ගුණපාල සේනාධීර මහාතා අම්පාර දිසාවේ සහ මඩකලපු දිස්ත්‍රික්කයන්හි පැවති ඓතිහාසික නටබුන් රාශියක් ගැන දක්වයි. බෝවත්තේගල කොටා දැමූ හෙල කෝන්ගල බඹරගස් තලාව කිරිපොකුණ හෙල විහාරෙ ගල විහාර ගල් කන්ද කුඩිම්බිගල කිරලාන ලේනම පානම විහාරය ලයින් මලේ නෙළුම්පත් පොකුණ රොට්ටකුලම තිස්නා උල කෙම නාවල් ආර් කුලම් ශාස්ත්‍රවෙල විහාරය රුහුණු මඟුල් මහා විහාරය ගලහිටිඔඩේ අකුරු කෙටූ ගල නාමලුව කරඳ හෙල ආදී ස්ථාන රාශියක් ගැන එතුමා සඳහන් කරයි. පූජ්‍ය එල්ලවාල මේධානන්ද හිමියන්ද මේ ස්ථානයන්ට නැවත වැඩම කොට හෙළි දක්වන ලද කරුණු බොහෝය. මේ ස්ථාන අතරින් වැල් එල්ලූ ගොඩ කන්ද වැදගත් පුද බිමකි. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් මෙම ස්ථානයේ පැවති සෙල් ලිපි 17 ක් 1970 දී පමණ පිටපත් කරවා ඇත. මෙණරාගල දිසාවේ සිඹලාන්ඩුව දිසාවට අයත් මහකලුගොල්ලෙන් කි.මී. 03 ක් පමණ දුරකින් කුමන රක්ෂිතයේ පිහිටි බුදු පැටුන් කන්ද ගැන පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් සිය නවතම ශිලා ලිපි ගවේශණ කෘතියේ දක්වන ලද සටහනද ඉතා වැදගත්ය.මෙහි ගල් ලෙන් දෙකක කටාරම් කොටවා ඇති බවත් එහි එක් ලිපියක රජ උති පුත අබය අයහ ජිත දෙවිතිශය ලෙණෙ යනුවෙන් සඳහන් වන බව උන් වහන්සේ වැඩි දුරටත් දක්වා තිබේ.

ත්‍රස්තවාදී කලබල නිසා 1985 සිට 2003 වර්ෂය පමණ දක්වා මේ ප්‍රදේශය යලිත් ඝන වනයට හසුවී මිනිස් ඇසුරට වහන්ව ගියේය.2004 මුහුදු ගොඩ ගැලීම නිසා යාල වන උයනේ කොටසක් එයට යට විය එම තත්වය යටතේ කුමන අභය භූමියේ ඓතිහාසික ස්ථාන වෙත ළඟා වීම අතිශය දුෂ්කර විය.පණ්ඩිත ගුණපාල සේනාධීර මහාත ගේ කෘතියේ දක්වන පරිදි අතීතයේ දී යාල අභය භූමියේ පැවති දුෂ්කර තත්වය මොනවට පැහැදිලි වෙයි. නැවත මෙම පෙදෙස මිනිස් ඇසුරෙන් වෙන් වූ පසු යලිත් එහි පිවිසීම ඉතා දුෂ්කර කටයුත්තක් විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අණසක තුළින් ඈත්ව පැවති මේ පෙදෙස නිදන් හොරන්ට සහ අන්තවාදීන්ට නිදහසේ සැරිසරන්නට හැකි වන්නේ ඒ නිසාවෙනි.කෙසේ වෙතත් නැගෙනහිර ප්‍රදේශයේ පුරාවස්තු ආරක්ෂා කරලීමේ වුවමනාව පිට ජනාධිපති කාර්ය සාධක බලකායක් ජනපති වරයාගේ ප්‍රධානාත්වයෙන් මේ අතර තුර පිහිටුවීම නිසා මුහුදු මාහ විහාරය වැනි ඓතිහාසික ස්ථානයන් සුරක්ෂිත කරලීමට යම් කිසි ආරම්භයක් සනිටුහන් විය.

# බෞද්ධාලෝකය

මොණරාගල වෙල්ලස්සේ හඬ නම් වූ ස්වේච්ඡා සංවිධානය විසින් මෙම කර්ය සාධක බලකායේ සාමාජිකයෙකු වන මහාචාර්ය රාජ්සෝමදේව මහතාට කරන ලද ආරාධනයක් මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය සහතිව ගවේශණයක් ආරම්භ කරනු ලබන්නේ මේ අතරය. ඔහු ගේ ගවේශණ සීමාව යාල හා කුමන රක්ෂිතයන් තුළ පවතින ඓතිහාසික නටබුන් වෙත යොමු වූ අතර මෙතෙක් වාර්තා ගතව පවතින ස්ථාන සහ සෙල් ලිපි නැවත ගවේශණය කරමින් විධිමත්ව නවීන දත්ත මත වාර්තා කිරීම එහි අරමුණ විය. මේ ගවේශණය නිසා රුහුණේ වසන් වූ ඉතිහාසයට නව ආලෝකයක් ලැබෙන බව කිව යුතුය.

මීට පෙර පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් ගේ ගවේශණයට ලක් වූ බුදු පැටුන් කන්ද ස්ථානයේ තිබෙන වැදගත්ම ස්මාරකයක් හඳුන්ගන්ටත් වාර්තා කරලීමටත් ලක් වන්නේ මේ ගවේශණය තුළය. බුදු පැටුන් කන්ද යන නාමය එයට හිමි වන්නේ ද මේ ස්මාරකය නිසාවෙනි. එනම් අවලෝකිතේශ්වර සහ මෛත්‍රී බෝසතුන් පිරිවරා ගත් හිටි බුදු පිළිම වහන්සේ නමක් එහි දක්නට වීමයි.මෙම ස්ථානය ප්‍රථමයෙන් හඳුනාගන්නට වූ කාලයේ එම ප්‍රතිමා වහන්සේ ලා නිරුපද්‍රිතව පැවති බවට වාර්තා වෙන අතර රාජ් සෝමදේව මහතා ගේ ගවේශණයෙදී දක්නට ලැබී ඇත්තේ බුදු පිළිම වහන්සේ ගේ සහ මෛත්‍රී බෝසතුන් වහන්සේ ගේ හිස සුන් රූපයන්ය. දැනට ආරක්ෂාව පවතින්නේ අවලෝකිතේශ්වර බෝසතුන් ගේ ශීර්ෂය පමණි. මෙම ස්මාරකය බුදුරුවගල සහ කුෂ්ඨරාජ ගල බෝධිසත්ව රූපය වැනිම වූ වැදගත් ස්මාරකයක් වෙයි.

බෝධිසත්වයන් පිදීම නැගනෙහිර වෙරළ තීරයට විශේෂයෙන්ම ආවේණිකය. එහි පවතින වැදගත් ෙ ඓතිහාසික සිද්ධස්ථාන වල මෙම බෝධිසත්ව වන්දනාව දිගටම දක්නට තිබේ. මුහුදු මහා විහාරයද ඉන් එක් ස්ථානයකි. ලක්දිව නොබෝසත්හු නොරජ්වම්හ යයි සෙල් ලිපි වල ලියා තබන්නට පෙර රජ දරුවන් තැත් කරන ලද්දේ මහරජ අභිධානය දරාගත් රජු හික්මවන්නටය. විශේෂයෙන්ම නැගෙනහිර වෙරළ තීරයේ පවතින වරායවල් ආශ්‍රයෙන් දියුණු වූ වානිජ සබඳතා හරහා මෙම බෞද්ධ සභ්‍යත්වයට මහත් පිටිවහලක් ලැබීණ. ධනවතුන් ගේ ආශ්‍රය මෙම ස්ථාන දියුණු කිරීමට ලැබීම එහි විශේෂයයි. සිංහල රජවරුන් ගේ අනුග්‍රහය මෙන්ම විදෙස් බෞද්ධ පින්වතුන් ගේ අනුග්‍රහය ලැබුණ මේ ඓතිහාසික ප්‍රදේශයේ සංස්කෘතික ආලෝකය යටත් විජිත ග්‍රහණය නිසා නිවී ගියේය. වත්මන්හි මහාචාර්ය රාජ් සෝමදේවයන් විසින් ආලෝකමත් කරනුයේ එකල පැවති මහා ශිෂ්ඨාචාරයේ සළකුණුය. මෙතෙක් විධීමත්ව ගවේශණයකට බඳුන් නොවූ මේ ප්‍රදේශ විධිමත් ලෙසට වාර්තා කිරීමෙන් පසු ඒවා ආරක්ෂා කරලීමට රජයට මූලිකත්වය ගත හැකිය. සිද්ධස්ථායන් සුද්ද පවිත්‍ර කොට ආරණ්‍ය. වාසී භික්ෂූන් වහන්සේලාට වෙන් කර දිය හැකිය. එය පැරණි රජ සිරිතය . දැනට නැගෙනහිර ජනාධිපති කාර්ය සාධක බලකාය මූලිකත්වය ගන්නේ ආරක්ෂාව සැපයීමට පමණකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුමේ විද්වත් භාවිතයත් මෙරට විශ්ව විද්‍යාලයන්හිවිද්වතුන් විශේෂයෙන් මහාචාර්ය සෝමදෙව මහතා වැනි විද්වතුන්ගේ දායකත්වයත් මගින් ශාස්ත්‍රීය එළඹුකට පැමිණිම ඉතා වැදගත්ය. මෙම කර්ය සාධක බලකායේ සාමාජිකයෙකු වන මහාචාර්ය රාජ්සෝමදේව මහතාට අනුග්‍රය දක්වමින් වෙල්ලස්සේ හඬ නම් සංවිධානය විසින් ඒ ජාතික කටයුත්තට අත ගසා තිබීමද සුභ ලකුණකි. මන්ද පුරාවස්තු මෙන්ම අපගේ පැරණි සභ්‍යාත්වය සුරැකීමට ජනතා සාභාගිත්වයද අත්‍යවශ්‍ය බැවිනි.

**මතුගම සෙනෙවිරුවන්**

# මගෙ එස් පහයි ආර් තුනයි

පෙර මෙන් නොව මේ ලෝකය අද ගත්තම
එකම ගමක් හැරවෙන්නෙම  අලුත් දේට
තත්පරයෙන් හැදෙයි යමක්

දස දහසක් නව නිපැයුම් ලෝකය වහගෙන
රිස්සේ යස දියුණුයි! මනුස්සකම සෙව්වෙමි,
අහුමුළු අස්සේ

බිලූමැන්ඩල් කසල කන්ද මතකද පුපුරා
හැලුනා ක්ලූ නැතුවම ජීවිත ටික මොහොතින්
යටකර දැමුණා

බිලි බාගෙන ඕසොන් වියනත් ටික ටික දිය
වෙනවාපිලිකාවට අත වන වන   මහරගමට
ගොඩවෙනවා

වැඩ ගන්නට ආර් තුනෙන්  දැන්වත් හිත යොමු
කරන්නගොඩ එන්නට මේ විපතින් එනවද අත
අල්ල ගන්න

එස් පහ සහ ආර් තුනත් කොපි කෙරුවේ බුදු
දහමින් ඇස් වහගෙන කියතැකි මට තෙරුවන්
ගුණ සිහි කරමින්

අතැඹුල වාගෙයි පැරැන්නො දැන හිටියේ මේ
එස් පහසිතැඟිය ලෙස ඉන් දිනුවා බැලුව
වගේමයි පස්මහ

පලදායිතාවය ගැන කතා කරයි දැන් ලෝකෙම
වල වැදිලා හිටිය ඇතිනෙ නැගිට ගනිමු දැන්
මේකෙම

රැක දෙන ලෙස මේ ලෝකය හෙට උපදින
නො දරුවන්ට එක දෙක තුන විමසමු දැන් ආර්
කියල අඳුනගන්ට

ගෙන එන දේවල් ගෙදරට  අඩු කරමුද අංක
එකට අනවැසි දේ ගොඩ ගැහුණොත්
හේතුවක්නෙ එයත් දූකට(Reduce  )

කැඩුන බිඳුන දේ තිබුනොත් හදල කරල වැඩට
ගන්න කුණු කන්දට එකතු කරන දේවල් ටික
අඩු කරන්න (Reuse)

අහක දාන බෝතල් වැනි දෙයින් කරයි නව
නිපැයුම් නොහැකි නේද ඉවතලන්න  පුරුදු
කරමු සකසුරුවම් (Recycle)

අතේ මුදල රැකගන්නට හිතේ සතුට වැඩි
වන්නට පුතේ මමත් වැඩ කරනව නුඹට
ලෝකෙ රැක දෙන්නටඅතැඹුල වාගෙයි
පැරැන්නො දැන හිටියේ මේ එස් පහ

සිතැඟිය ලෙස ඉන් දිනුවා බැලුව වගේමයි
පස්මහ පලදායිතාවය ගැන කතා කරයි දැන්
ලෝකෙම

වෛද්‍ය  ඉන්ද්‍රාණි  රත්නායක

# බොදු සමළු පුවත්

## 2022 වසරේ ලංකාවේ ඇතිවූ අරාජිකත්වය පිළිබඳ සොයා බැලීමේ ස්වාධීන පරීක්ෂණ කොමිෂන් සභාව

2022 වසරේ ලංකාවේ ඇතිවූ අරාජිකත්වය පිළිබඳ සොයා බැලීමේ ස්වාධීන පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිතුමිය ප්‍රමුඛ  සාමාජිකාවන්ට අධිකාරී පත්‍ර පිළිගැන්වීම මහනුවර ශ්‍රී දළදා මාලිගාව අභියස පිහිටි රන් ආයුධ මණ්ඩපයේ දී 2023.03.03 දින සිදු කෙරිණි.

ස්‍යාමෝපාලී වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ  අනුනායක සාහිත්‍ය චක්‍රවර්තී ආචාර්ය අතිපූජ්‍ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අභිධාන අනුනායක ස්වාමීන් වහන්සේ සහ ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ අනුනායක අධ්‍යාපනපති  අතිපූජ්‍ය ආණමඩුවේ  ශ්‍රී ධම්මදස්සී අනුනාහිමිවරුන්ගේ මූලසනාරූඪත්වයෙන්  සහ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයට කොමිෂන් සභාවේ ගරු සභාපතිනී විශ්‍රාමික දිසා විනිසුරු පර්ල් කරල්ලියද්ද, ගරු ලේකම් දුලිප් පලිහවඩන යන මහත්ම මහත්මීන් ඇතුළු සම්මේලනයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික සාමාජිකාවන් ද සහභාගී වූහ.








## 2022.03.17 දින සම්මේලන මූලස්ථානයේ දී
## කොමිෂන් සභාවේ සමාජිකයන් දිවුරුම්දීම

2022 වසරේ ලංකාවේ ඇතිවූ අරාජිකත්වය පිළිබඳ සොයා බැලීමේ ස්වාධීන පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයින්ට අධිකාරී පත්‍ර පිළිගැන්වීමේ උත්සවය මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශවයේ ජ්‍යෙෂ්ඨ අනුනායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය ඕමාරේ කස්සප නායක ස්වාමීන් වහන්සේ, බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලයේ ගරු සභාපති අතිපූජ්‍ය දිවියාගස යසස්සී නායක ස්වාමීන් වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක අතිපූජ්‍ය නැදගමුවේ විජය මෛත්‍රී නායක ස්වාමීන් වහන්සේ, ශ්‍රී ලංකා අමරපුර නිකායේ ශ්‍රී සම්බුද්ධ ශාසනෝදය පාර්ශවයේ මහානායක සිරි සුගත ශාසන වංසපාල ගණාචාර්ය ශ්‍රී සුභූත වංසාවතස්ස ප්‍රවචන කීර්ති ශ්‍රී අතිපූජ්‍ය වස්කඩුවේ මහින්දවංශ මහා නායක ස්වාමීන් වහන්සේලාගේ මූලාසනාරුඪත්වයෙන් සම්මේලන මූලස්ථානයේ දී සිදු කෙරිණි.

සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික භවතුන්ගේ සහභාගිත්වයෙන් පැවති මෙම උත්සවයේ දී ජාත්‍යන්තර කටයුතු පිළිබඳ විශේෂඥ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී මොහාන් සමරනායක මහතා " ඉන්දු චීන මැදිහත්වීම හමුවේ ශ්‍රී ලංකාවේ අනාගතය" මැයෙන් දේශනයක් ද පැවැත්විණි









## ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස ගෞරව ප්‍රණාම උළෙල

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික සමාජසේවා මණ්ඩලය මගින් සංවිධානය කළ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස ගෞරව ප්‍රණාම උළෙල සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික සමාජසේවා මණ්ඩලයේ ගරු සභාපති වසන්ත ද සිල්වා මහතා ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් සම්මේලන මූලස්ථානයේදී ඉකුත් දා (2023.03.04) පැවැත්විණි.

ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස පාලක මණ්ඩල වල සේවාව අගයමින් ප්‍රණාම පුද කිරීම මෙහිදී සිදු කෙරිණි. තරුණ හා වැඩිහිටි අංශ යටතේ මෙම සම්මාන පිරිනැමුණු අතර සේවා ඇගයීම තුළින් ඵලදායීතාව ඉහළ නැංවීම මෙම ප්‍රණාම උළෙලෙහි අරමුණයි.

ප්‍රථම ස්ථානය - සමරතුංග ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසය

දෙවන ස්ථානය - මාලඹේ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිකේතනය සහ රත්ගම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසය












